ශ්‍රීලන්කන් කේටරින් සමාගම - **2019/ 2020**
-----------------------------------------------

**1.1** මතය
-----

ශ්‍රී ලන්කන් කේටරින් සමාගමේ ("සමාගම") 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමණාකරනයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වතක්ම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකරණයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණය ගැති බැර ශේෂ හිලව් කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ණය ගැති ශේෂය රු. 6,198,338 කින් ඌන ගණනය වී තිබුණි. | මෙය පූර්ව වර්ෂවලදී සිදුකරන ලද ක්‍රමවේදය වේ. කෙසේ වුවද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | බැරශේෂ වෙනම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශවල පෙන්වීමට කටයුතු කලයුතු වේ. |

## 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 මාර්තු 31 දින වන විට ලැබිය යුතු මුළු ගිණුම් ශේෂය රු. මිලියන 11,347 ක් විය. මේ අතරින් සියයට 94 කට සමාන වන රු. මිලියන 10,686 ක් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් ලැබිය යුතු විය. තවද ඉහත ශේෂයෙන් රු. මිලියන 4,980 ක් වසරකට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුනි.2020 මාර්තු 31 දිනට ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් අයකර ගත යුතු වූ ශේෂය එදිනට සමාගමේ මුළු වත්කම් වටිනාකමෙන් සියයට 67 ක් නියෝජනය වේ. එසේ වුවද මෙම ලැබිය යුතු ශේෂය පිළිබඳව නොසලකා සමාගම විසින් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට රු. මිලියන 1,701 ක් වූ ලාභාංශ ගෙවා තිබුණි. | කළමනාකරණය විසින් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමින් ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කරමින් සිටි. | ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා පියවර ගත යුතු වේ. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරණ යහපාලනය පිළිබඳ මඟ පෙන්වීම සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| i) 7.4.5 ඡේදය | 2020 මාර්තු 31 දිනට සමාගමේ ස්ථාවර වත්කම් සත්‍යාපනය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර නොතිබුණි. | සමාගම පෙරදී මෙයට අනුකූලව කටයුතු කර ඇත. එසේ වුවද, කෝවිඩ් 19 වසංගතය නිසා සමහර ප්‍රදේශ අගුළු ලන ලද අතර සමහර ප්‍රදේශවලට ඇඳිරි නීතිය පනවන ලදී. මේ හේතුවෙන් සමීක්ෂණ මණ්ඩල සාමාජිකයින්ට හා විගණකවරුන්ට වත්කම් | සමාගමේ ස්ථාවර වත්කම් සත්‍යාපනය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකිරීමට සමීක්ෂණ මණ්ඩල පත්කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | සත්‍යාපනය සඳහා සහභාගීවීමට නොහැකිවිය. එසේ වුවත් සමාගමේ වර්ෂාවසාන තොග ආයතනය අවම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් සිදු කර එහි නිවැරදිතාවය තහවුරු කිරීමට සමාගම කටයුතු කරන ලදී. | |
| ii) 9.3.1 (i) | සමාගමේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය සඳහා අදාල අමාත්‍යාංශයේ අනුමැතිය හා මහාභාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | සමාගම විසින් බඳවාගැනීම් හා උසස්කිරීම් සඳහා සමාගමේ මානව සම්පත් අත්පොත හා ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය 2016 අගෝස්තු 16 හා 2019 ඔක්තෝබර් 10 යන දිනවලදී අනුමත කරන ලද වෙනස්කම් භාවිතා කරනු ලැබේ ඉදිරියේදී මෙම මානව සම්පත් පිළිබඳ අත්පොත මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලැබේ. | සමාගමේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටිය සඳහා අදාල අමාත්‍යාංශයේ අනුමැතිය හා මහාභාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගත යුතු වේ. |

**1.9** තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) සමාගම විසින් ආපදා යථා තත්ත්වයට පත්කිරීමේ අඩවියක් (Disaster Recovery Site) ක්‍රියාත්මක කර නොතිබුණි. එම පද්ධතියක් නොමැතිවීම, තොරතුරු විනාශකිරීමේ සිදුවීම්වලට හෝ අවපාත කාලපරිච්ඡේදයකදී සංවිධානය අඩපණ වීමකට හේතු විය හැක. | ශ්‍රී ලන්කන් කේටරින් සමාගමේ ආපදා යථා තත්ත්වයට පත් කිරීමේ පද්ධතියක් නොමැතිවීමේ අවදානම,ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් ISO 27001 හා ISO 20000 සහතික ලත් කණ්ඩායම් තොරතුරු ආරක්ෂණ රාමුවක් මඟින් බොහෝ දුරට අවම කර ඇත. පද්ධති පිටපත් සහ ජාල පුනරුත්තීන් BCM අවශ්‍යතාවයන් සඳහා ස්ථාපිත කර ඇත. දැනට භාවිතා කරන ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ පද්ධතිය UL BCP හා DR යන විකල්පවලින් ආවරණය කර ඇත. | ආපදා හෝ අනතුරු නොසලකමින් මෙහෙයුම් කටයුතු සිදුකළ හැකි බවට සහතික කර ගැනීම සඳහා ආපදා යථා තත්ත්වයට පත් කිරීමේ අඩවියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව. |
| ආ) මයික්‍රෝසොෆ්ට් කෝපරේෂන් විසින් වින්ඩෝස් 07 මෙහෙයුම් පද්ධතිවල ආරක්ෂණ පද්ධති, | සමාගමේ පවත්නා සියලු පරිගණක අතරින් පුද්ගලික පරිගණක 64 ක් පමණක් වින්ඩෝස් 10 සමඟ අනුකූල | සමාගම විසින් එහි තොරතුරුවල ආරක්ෂාව වෙනුවෙන් |

| | | |
|---|---|---|
| වින්ඩෝස් යාවත්කාලීන කිරීම් (windows updates) සහ වින්ඩෝස් මෙහෙයුම් පද්ධති සඳහා තාක්ෂණික සහාය ලබාදීම් නතර කර තිබුණත් වින්ඩෝස් 07 ස්ථාපිත පුද්ගලික පරිගණක පැවතුනි. මේ හේතුවෙන් මෙම පුද්ගලික පරිගණක පරිගණක, වෛරස් හා ගෝලීය තර්ජනවලට මුහුණ දීමේ අවදානමක් පවතී. | නොවේ. කෝවිඩ් 19 වලින් පසු සමාගමේ මෙහෙයුම් කටයුතු සාමාන්‍යකරණය වූ පසු ආරක්ෂිත ක්‍රමවලින් බැහැරවීම් පිළිබඳ අවදානම් හඳුනාගෙන විසඳුම් සෙවීමට කටයුතු කරනු ලැබේ. | යාවත්කාලීන තාක්ෂණය භාවිතා කළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

අ) සමාලෝචිත වර්ෂයේ සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 4,759 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව පූර්ව වර්ෂයේ ලාභය රු. මිලියන 5,602 ක් විය. මේ නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 843 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පූර්ව වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ ගුවන්යානා සඳහා ආහාර සපයන මුළුතැන්ගේ (Flight Kitchen) ආදායම රු. මිලියන 616 කින් අඩු වීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ආ) සමාගමේ 2015/16 වර්ෂයේ සිට 2019/20 දක්වා එකතු කල අගය පිළිබඳ විස්තර පහත දී ඇත.

| විස්තරය | 2019/20 | 2018/19 | 2017/18 | 2016/15 | 2015/16 |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| බදු පසු ලාභය (ලාභාංශය ගෙවීමට පෙර) | 4,759.51 | 5,602.50 | 3,890.30 | 3,736.39 | 3,637.86 |
| <u>එකතු:</u> | | | | | |
| සේවක පඩිනඩි | 1 202.97 | 1,128.26 | 1,019.78 | 890.15 | 788.02 |
| <u>රජයට ගෙවූ ලාභාංශ (සෘජු)</u> | 130.10 | 130.10 | 130.10 | 130.10 | 196.78 |
| වරණීය කොටස් | | | | | |
| සාමාන්‍ය කොටස් | 1,701.25 | 3,280.18 | 5,314.10 | 3,093.48 | 2,100.00 |
| <u>රජයට ගෙවූ බදු</u> | | | | | |
| ජාතිය ගොඩනැගීමේ | 0.41 | 0.55 | 0.16 | 0.58 | 0.47 |

| | | | | | |
|---|---|---|---|---|---|
| බදු | 7.64 | 13.55 | 11.42 | 13.13 | 4.03 |
| එකතු කළ අගය මත බදු | 33.95 | 48.79 | 41.99 | 34.73 | 15.01 |
| වෙනත් බදු (ESC) | | | | | |
| <u>ක්ෂය හා ක්‍රමක්ෂය කිරීම්</u> | 377.72 | 218.33 | 196.55 | 284.67 | 305.53 |
| එකතුව | <u>8,213.55</u> | <u>10,422.26</u> | <u>10,604.40</u> | <u>8,183.23</u> | <u>7,047.70</u> |

සමාගමේ එකතු කල අගය පූර්ව වර්ෂයේ සිට අඩු වී තිබූ අතර, කෝවිඩ් 19 වසංගත තත්ත්වය හා සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ අඩුවෙන් ගෙවීම ඒ සඳහා හේතු වී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

| | 2019/20 | 2018/19 | 2017/18 | 2016/17 | 2015/16 |
|---|---|---|---|---|---|
| ජංගම වගකීම් වලට ජංගම වත්කම් (වාර ගණන) | 6.16 | 7.82 | 6.44 | 8.76 | 9.74 |
| ක්ෂණික අනුපාතය | 6.01 | 7.55 | 6.14 | 8.46 | 9.43 |
| ණය හිමිකම් අනුපාතය | 0.14 | 0.21 | 0.26 | 0.19 | 0.21 |
| EPS - කොටස් අනුපාතය | 5.06 | 5.96 | 4.14 | 3.97 | 3.87 |
| කොටසකට ලාභාංශය | - | 4.47 | 3.10 | 3.38 | 3.29 |
| දළ ලාභ අනුපාතය | 81% | 79% | 77% | 77% | 77% |
| හිමිකමට ඉපැයුම | 39% | 59% | 58% | 46% | 49% |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) සමාලෝචිත වර්ෂයේදී ජංගම වගකීම් වලට ජංගම වත්කම් අනුපාතය (ජංගම අනුපාත) සහ ක්ෂණික අනුපාතය අඩු වී තිබූ අතර ඒ සඳහා ජංගම වත්කම් යටතේ ඇතුලත් කර තිබූ නිදහස් කළ හැකි වරණීය කොටස් ජංගම නොවන ජංගම වත්කම් යටතේ වර්ගීකරණය කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ආ) බදු පසු ලාභයේ අඩු වීම නිසා සමාලෝචිත වර්ෂයේ කොටසක ඉපැයුමේ අඩුවීම රු. 0.90 ක් වැඩි වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සමාගමේ අරමුණු වන්නේ ගුවන්යානා සඳහා ආහාර සපයන මුළුතැන් ගෙවල් මෙහෙයවීම හා නඩත්තු කිරීම, ආහාරපාන සහ ගුවන් මගීන්ට අවශ්‍ය වෙනත් දේ සැපයීම, (Victuals) ගුවන් සේවා සඳහා මගී නවාතැන් පවත්වාගෙන යාම, ගබඩා හා බන්ධිත ගුදම් අත්පත් කර ගැනීම සහ සැපයීම ආදිය සහ කුඩා හා විශාල ආපනශාලා (Cafe & Restaurant) හිමිකරුවන් ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමත් වේ. සමාගමේ එක් එක් උත්පාදන ඒකක වල පසුගිය වර්ෂ 03 සඳහා විකිණුම් ආදායම් සහ ලාභ/ අලාභ පහත පරිදි වේ.

| ආදායම් ප්‍රභවය | 2019/20 | | 2018/19 | | 2017/18 | |
|---|---|---|---|---|---|---|
| | මුළු ආදායම | වර්ෂය සඳහා ලාභ / අලාභ | මුළු ආදායම | වර්ෂය සඳහා ලාභ / අලාභ | මුළු ආදායම | වර්ෂය සඳහා ලාභ / අලාභ |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ගුවන්යානා වලට ආහාර සපයන මුළුතැන් ගෙවල් (Flight Kitchen) | 7,209.31 | 4,101.20 | 7,825.30 | 4,799.99 | 6,754.96 | 3,140.60 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල (BIA) | 1,219.99 | 435.29 | 1,266.32 | 545.76 | 1,210.34 | 544.01 |
| වැනිලා පොඩ් (Vanilla Pod) | 34.00 | 7.16 | 31.88 | 6.96 | 25.17 | 5.86 |
| සෙමන්දු ආපනශාලාව (Semondu Restaurant) | 25.48 | 11.11 | 38.60 | (6.05) | 90.81 | (5.72) |
| ට්‍රාන්සිට් හොටෙල් (Transit Hotel) | 173.76 | 49.17 | 174.58 | 67.80 | 149.45 | 50.42 |
| එමිරේට්ස් ලොන්ජ් (Emirates Lounge) | 128.33 | 65.21 | 140.23 | 73.56 | 133.53 | 67.39 |
| මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල ආපනශාලාව (MRIA) | 7.5 | (1.96) | 12.8 | (15.47) | 9.45 | (21.32) |
| පිරිසුදු කිරීම් සේවා (Laundry) | 227.75 | 92.33 | 259.95 | 129.96 | 223.81 | 109.06 |
| එකතුව | 9,026.12 | 4,759.51 | 9,749.66 | 5,602.51 | 8,597.52 | 3,890.30 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i සෙමන්දු ආපනශාලාවෙන් පූර්ව වර්ෂයේදී ලද ලාභය රු. මි. 38.60 සිට සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 25.48 දක්වා අඩු වී තිබුණු අතර ආපනශාලාවෙන් ලද වර්ෂයේ ලාභය රු. මිලියන 17.16 කින් වැඩි වී තිබුණි.

ii මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල ආපන ශාලාව ආරම්භයේ සිටම පාඩු පිට පවත්වාගෙන ගොස් තිබුණි. එහි පූර්ව වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ලාභ පිළිවෙලින් රු. මිලියන 15.47 ක් හා රු. මිලියන 1.96 ක් වී තිබුණි.

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් 2006 ජනවාරි මාසයේදී නිකුත් කරන ලද අංක 08 දරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 (ආ) පරිදි අවම වශයෙන් වර්ෂ 3 කදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් කළ යුතු අතර එම මාර්ගෝපදේශයේ 4.2.1 (ඉ) අනුව එම සැලැස්ම මාස 6 ක් නොඉක්මවන කාල පරිච්ඡේද තුළ දී යාවත්කාලීන කල යුතු වේ. එසේ වුවද, සමාගම විසින් එබදු ප්‍රසම්පාදන සැලසුමක් සකස් කර නොතිබුණි. | ශ්‍රී ලන්කන් කේටරින් සමාගමට ප්‍රාග්ධන වියදම් අය වැය ඇතුලත් තුන් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් ඇත. එසේ වුවද, ව්‍යාපාරයේ ස්වභාවය අනුව අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වාර්ෂිකව ප්‍රසම්පාදන සැලසුමක් සකස් කරනු ලබයි. 2019 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර එය මාස 6 ක් නොඉක්මවන කාල පරිච්ඡේද තුලදී යාවත්කාලීන කළ යුතු බව. |
| ආ) | ඉහත සඳහන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (ආ) ඡේදයේ සඳහන් කරුණු අනුව ප්‍රසම්පාදන කාල සටහනක් අදියර II න් පිළියෙළ කර ප්‍රසම්පාදන කමිටුවෙන් අනුමැතිය ලබාගත යුතු වේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුලදී සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කර නොතිබුණි. | වර්තමානයේදී වටිනාකම රු. මිලියන 5 ඉක්මවන ප්‍රසම්පාදන සඳහා පමණක් ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙළ කරනු ලැබේ. | සියලු ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කල යුතු බව. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| ශ්‍රී ලන්කන් කේටරින් සමාගම විසින් 2030 වර්ෂයේදී ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් දැනුවත්ව නොසිටීම නිසා තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට අසමත්ව තිබූ අතරම, ඒවා ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාකාරකම්, ඉලක්ක ළඟාකර ගැනීම පිළිබඳ සංසිද්ධිස්ථාන හඳුනාගැනීම පිළිබඳ ඇගයීම සඳහා නිර්ණායකයන්ද හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේදී සමාගම (ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම) සමඟ එකතුව කටයුතු කරනු ලැබේ. | අදාල තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට සහ එම අරමුණු හා ඉලක්ක වලට අනුගතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු වේ. |